සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) සන්නිවේදන ක්‍රියාවලියේ දී සංකේත භාවිතය ඉතාමත් වැදගත් වේ. ශුද්ධ වූ බයිබලය තුළ සංකේත භාවිතයෙන් ලියවී ඇති ග්‍රන්ථ වනුයේ,

(1) දානියෙල් පොත / හෙබ්‍රව් ලිපිය (2) එළිදරව් පොත / රෝම ලිපිය
(3) දානියෙල් පොත / එළදරව් පොත (4) ගලාති ලිපිය / එස්තර් පොත

(02) පුරාණ ගිවිසුමේ ඉතිහාස පොතකි.

(1) ගණන් කථාව (2) විරාවලිය
(3) හිතෝපදේශය (4) ගීතාවලිය

(03) ශුද්ධ වූ පාවුලු තුමාගේ හසුන්වලට අමතරව වෙනත් හසුන් ලියූ කිතු සමිඳුන්ගේ අපෝස්තුලුවරුන් වන්නේ,

A පේදුරුතුමා B මතෙව්තුමා
C ජාකොබ්තුමා D තෝමස් තුමා

මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

(1) B හා C ය. (2) C හා D ය. (3) A හා D ය. (4) A හා C ය.

(04) එළිදරව් සාහිත්‍යයේ එන සුදුමැලි වර්ණ සංකේතයෙන් අදහස් කරන්නේ,

(1) මරණය (2) සාගතය (3) ජයග්‍රහණය (4) යුද්ධ ය.

(05) එදිනෙදා ජීවිතයට හා සම්බන්ධ ප්‍රඥාවට අදාළ උපදෙස් අපට ලබා දෙන්නේ,

(1) ධර්මදේශකයා (2) හිතෝපදේශය 6
(3) ජෝබ් (4) සලමොන්ගේ ප්‍රඥාව 6

(06) එම්මාවුස් බලා ගිය ශ්‍රාවකයන් දෙදෙනා ක්‍රිස්තුන් වහන්සේ හඳුනා ගත්තේ,

(1) උන්වහන්සේ ශුද්ධ ලියවිල්ලේ ඇති දේ පැහැදිලි කළ අවස්ථාවේ.
(2) උන්වහන්සේ ප්‍රාතිහාර්ය සිදු කරන අවස්ථාවේ.
(3) උන්වහන්සේ යාච්ඥා කරන අවස්ථාවේ.
(4) උන්වහන්සේ රොටි ආශිර්වාද කර පූප කඩන අවස්ථාවේ.

Department of Education – Western Province

(07) පීඩාකාරී බලය නියත ලෙස පරාජය වන බව අපට පෙන්නුම් කරන්නේ,

(1) රාජ්‍ය සභා ප්‍රඥාවය. (2) ද්විත්ව වාදය ය.

(3) යුගාන්තවාදය යි. (4) අභිධාර්මික ප්‍රඥාවයි.

(08) ''බෙන්ජමින්ගේ ගෝත්‍රයට අයත්ව තාර්සස්හි උපත ලැබූ එතුමා ජුදා දහම, නීතිය හා ව්‍යවස්ථාව පිළිබඳව ගැඹුරු ඥානයක් තිබිණි. මෙහි සඳහන් පුද්ගලයා වන්නේ,

(1) ශුද්ධ වූ පාවුළුතුමා ය. (2) ශුද්ධ වූ පේදුරුතුමා ය.

(3) ශුද්ධ වූ ජාකොබ්තුමා ය. (4) ශුද්ධ වූ තෝමස්තුමා ය.

(09) ''මාගේ බැටළුවන් පෝෂණය කරන්න'' මෙය කා විසින් කාහට කියන ලද්දක් ද?

(1) ජේසුස් වහන්සේ විසින් ශු. පාවුලුතුමාට

(2) ජේසුස් වහන්සේ විසින් ගෝලයන්ට

(3) ජේසුස් වහන්සේ විසින් ශු. ජාකොබ්තුමාට

(4) ජේසුස් වහන්සේ විසින් ශු. පේදුරුතුමාට

(10) දේශීය කිතුනු සාහිත්‍යයක් ගොඩනැගීමට පුරෝගාමී වූ පියතුමා

(1) ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා ය. (2) ගරු පීටර් පිල්ලේ පියතුමා ය.

(3) ගරු ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා ය. (4) ගරු මසලින් ජයකොඩි පියතුමා ය.

(11) ශුද්ධ වූ සභාවේ විශ්වය බව වර්ධනය වන්නේ,

(1) ශුභාරංචිය සියලු දෙනා වෙත ගමන් කළ පමණට ය.

(2) කිතුනු සභා සමඟ සමගියෙන් කටයුතු කළ පමණට ය.

(3) ශුද්ධ වූ සභාවේ එකමුතුකම වෙනුවෙන් යාච්ඤා කළ පමණට ය.

(4) මීසම් සංඝයේ සියලු දෙනා සමගියෙන් කටයුතු කළ පමණට ය.

(12) කතෝලිකයන්ට එරෙහිව පනවා තිබූ සියලු නීති අවලංගු කර ලංකාව තුළ කැමති ආගමක් ඇදහීමේ නිදහස ලැබුණේ,

(1) නිදහසින් පසු යුගයේ ය. (2) බ්‍රිතාන්‍ය යුගයේ ය.

(3) ලන්දේසි යුගයේ ය. (4) පෘතුගීසි යුගයේ ය.

(13) දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ වන්නේ,

A භෝජනයක් B පූප කැඩීමක්

C ගිවිසුමක් D පරිශ්‍රමණයක්

මින් වඩාත් නිවැරදි පිළතුර වන්නේ,

(1) A හා B ය. (2) A, C හා D ය.

(3) B, C හා D ය. (4) A, B හා C ය.

(14) ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග ඇතුළත් වරණය වන්නේ,

(1) පූප / නුමුහුන් රොටි (2) පාස්කු බැටළුවා / තෙල්

Department of Education – Western Province

(3) තිත්ත පලා / මිදි යුෂ (4) රොටි / මස්

(15) ''මා මේ අනුශාසනා කරන විට මම ඔබට ප්‍රශංසා නොකරමි. මන්ද ඔබේ රැස්වීම්වල දී යහපතට වඩා අයහපත සිදුවන බැවිනි.'' ශුද්ධ වූ පාවුලුතුමා මෙම අනුශාසනය කළේ,

(1) එපීස සභාවට (2) රෝම සභාවට

(3) කොලොස්සි සභාවට (4) කොරින්ති සභාවට

(16) ශුද්ධ වූ මැක්ෂිමිලියන් කෝල්බේ මුනිතුමා ''වීර සෙබලා සඟරාව'' ආරම්භ කළේ,

(1) දෙව්මවුන්ගෙන් ආදරය ලෝ පුරා පැතිරවීමට ය.

(2) තම හැකියා අන් අයට බෙදා දීමට ය.

(3) වදකාගාරයේ සිටින සිරකරුවන් දිරිමත් කිරීමට ය.

(4) ජේසුතුමාගේ ආදරය ලෝ පුරා පැතිරවීමට ය.

(17) ආගම් භේද නොතකා ජුදා සිනගෝගයට හා මුස්ලිම් පල්ලියකට වැඩම කළ පළමු ශුද්ධෝත්තම පියතුමා වන්නේ,

(1) ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා

(2) 16 වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා

(3) ශුද්ධ වූ ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා

(4) ඩස වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා

(18) කිතුනුවන් වන අප පොරොන්දු දීමට කැඳවන ප්‍රසාද නිධාන වන්නේ,

A අභිවෘද්ධි ආලේපය B දිව්‍ය සත්ප්‍රසාදය

C රෝගීන්ගේ ආලේපය D ආශිර්වාද කාර බන්ධනය

(1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) C හා D ය.

(19) දේව ප්‍රේමයට විරුද්ධ පාපයක් වන්නේ,

(1) දෙවි කෙනෙක් නැතැයි සිතා කටයුතු කිරීම ය.

(2) මූල ධර්මවාදීන් පසුපස යාම ය.

(3) උඩඟුවෙන් දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කිරීම ය.

(4) වෙනත් දෙවි දේවතාවන්ට බාරවීමය.

(20) දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු වන්නේ,

(1) දේව වචනයට සවන් දීම / දෙවියන් වහන්සේට තුති පිදීම

(2) දෙවියන් වහන්සේට නමස්කාර කිරීම / ජන වන්දනාව සිදු කිරීම

(3) සභාවේ පිළිවෙත් ඉටු කිරීම / දෙවියන් වහන්සේට නමස්කාර කිරීම

(4) දෙවියන් වහන්සේට තුති පිදීම / පාපයට වන්දි ගෙවීම

(21) හතරවන දේව පනතට විරුද්ධ ක්‍රියා ඇතුළත් පිළිතුර වන්නේ,

(1) මිනිසාට අහිතකර ව්‍යාපාරවල යෙදීම

(2) තම හැකියා හා දක්ෂතා මත පමණක් ක්‍රියා කිරීම

(3) කිතුනුවකු ලෙස කිතුනුකමට සාක්ෂි නොදැරීම





Department of Education – Western Province

(4) තමන්ට පැවරී ඇති කටයුතු ඉටු නොකිරීම

(22) තම හෘදය සාක්ෂියට අනුව ඡන්දය භාවිතා කිරීම
(1) පුරවැසියන්ගේ යුතුකම් හා වගකීම් ය.
(2) රාජ්‍ය පාලකයන්ගේ යුතුකම් හා වගකීම් ය.
(3) දරුවන්ගේ යුතුකම් හා වගකීම් ය.
(4) දෙමාපියන්ගේ යුතුකම් හා වගකීම් ය.

(23) ජන්ම පාපී ප්‍රතිඵල ලෝක ආරම්භයේ සිට ම ක්‍රියාත්මක බවට උදාහරණයකි.
(1) ඊසාක්ව යාග කිරීමට මොරියා දේශයට රැගෙන යාම
(2) කායින් විසින් ආබෙල්ව ඝාතනය කිරීම
(3) ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්භාවයට පත්වීම
(4) ඊශ්‍රායෙල් ජනතාව රන් වස්සෙකු සදා පුද පූජා පැවැත්වීම

(24) අන්තර් ජාලයේ අසභ්‍ය වෙබ් අඩවි නැරඹීම මගින් කඩ කරන දේව පනතක් වන්නේ,
(1) පළමු හා නවවන දේව පනත්
(2) හත් වන හා දහවන දේව පනත්
(3) හයවන හා නමවන දේව පනත්
(4) පස්වන හා අටවන දේව පනත්

(25) ''අම්මේ, මම පළමුවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූ දා මරණයට පත් වුනත්, මම මාගේ දේව ජීවිතය නැති කර ගන්නේ නෑ කියා ජේසුට දුන් පොරොන්දුව ඉටු කළා'' මෙසේ ප්‍රකාශ කළේ,
(1) ශුද්ධ වූ කුඩා තෙරේසාතුමිය
(2) ශුද්ධ වූ මොනිකාතුමිය
(3) ශුද්ධ වූ මරිය ගොරෙත්තිතුමිය
(4) ශුද්ධ වූ සිසිලියා තුමිය

(26) ඔබගේ මිතුරියක දේවස්ථානයේ සන්ධ්‍යා මෙහෙයට සහභාගි වන විට අනවශ්‍ය ලෙස තම ශරීරයේ අන් අයට පෙනෙන ආකාරයෙන් ඇඳුමකින් සැරසී දේවස්ථානයට පැමිණෙයි. මෙය කිනම් පනතට විරුද්ධව පොළොඹවන ක්‍රියාවක් ද?
(1) තුන් සහ නමවන දේව පනත්
(2) හය සහ පස්වන දේව පනත්
(3) අට සහ තුන්වන දේව පනත්
(4) හය සහ නමවන දේව පනත්

(27) හවත්වන දේව පනතට හා දහවන දේව පනතට විරුද්ධ ක්‍රියා වන්නේ,
A අනුන්ගේ කාලය නාස්ති කිරීම
B අන් අයගේ අනාගතය විනාශ කිරීම
C කොපි කර, වංචා කර විභාග සමත් වීම
D අන් අයගේ අයහපත ගැන සතුටුවීම
මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,
(1) A, B හා C ය.
(2) A, C හා D ය.
(3) B, C හා D ය.
(4) A, B හා D ය.

(28) ''මම රජෙක් යයි ඔබ ම කියන්නෙහිය. මා උපන්නේත්, ලොව පහළ වූයේත්, සත්‍යයට සාක්ෂි දරන

Department of Education – Western Province

පිණිස ය'' මෙය කා විසින් කා හට කියන ලද්දක් ද?

(1) ජේසුස් වහන්සේ පිලාත්ට (2) ජේසුස් වහන්සේ හෙරෝද් රජුට
(3) ශුද්ධ වූ පාවුලතුමා නිරෝ අධිරාජ්‍යයාට (4) මෝසෙස්තුමා පාරාවෝ රජුට

(29) පෙන්තකොස්ත යන්නෙහි අර්ථය

(1) පනස්වන දිනය (2) දහවන දිනය
(3) හතළිස්වන දිනය (4) අටවන දිනය

(30) ශුද්ධවර ජොහාන් ශුභාරංචිය කියවනු ලබන්නේ,

(1) නත්තල් හා සාමාන්‍ය සමයේ (2) චතාරික හා ආගමන සමයේ
(3) චතාරික හා පාස්කු සමයේ (4) පාස්කු හා ආගමන සමයේ

(31) සත්‍ය ගරුකව සමාජයේ ජීවත් විය යුතු බවට ක්‍රියා පොත අපට ඉදිරිපත් කරන ඉතා වැදගත් සිදුවීමක් වන්නේ,

(1) මාර්තා හා මාරියා පිළිබඳ පුවත
(2) අනනියස් හා සපීරා පිළිබඳ පුවත
(3) සකේවුස් පිළිබඳ පුවත
(4) මෝසෙස් හා ආරොන් පිළිබඳ පුවත

(32) 1505ට පෙර ශ්‍රී ලංකාවේ කිතුනුවන් සිටි බවට සාක්ෂි ලෙස හමුවන 1912 දී සොයා ගන්නා ලද කුරුසිය කිනම් යුගයට අයත් ද?

(1) කෝට්ටේ යුගයට ය. (2) පොළොන්නරු යුගයට ය.
(3) ගම්පොළ යුගයට ය. (4) අනුරාධපුර යුගයට ය.

(33) එකම ක්‍රිස්තුන් වහන්සේව ලබා ගන්නා අපි සියලු දෙනා ම එකම ශරීරයක් වෙමු. එය එක ම ශුද්ධාත්මික ක්‍රිස්තු දේහයයි. මෙහි ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය ලෙස හඳුන්වන්නේ,

(1) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ (2) ශුද්ධාත්මයාණන් වහන්සේ
(3) දෙවියන් වහන්සේ (4) ශුද්ධ වූ සභාව

(34) දිව්‍ය පූජාවේ ප්‍රධානතම යැදුම වන්නේ,

(1) බොදුනින් පසු යැදුම (2) පශ්චත්තාපික යැදුම
(3) ස්තෝත්‍ර යාගික යැදුම (4) පොදු යැදුම

(35) සුරදූත ගීය ගායනා නොකරන්නේ,

(1) මංගල්‍ය හා ඉරිදා දිනය තුළ (2) චතාරික හා ආගමන කාලය තුළ
(3) චතාරික හා සාමාන්‍ය සමය තුළ (4) පාස්කු හා සාමාන්‍ය සමය තුළ

(36) කතෝලික සභාව පිළිගත් සභා වන්නේ,

A ඇංග්ලිකන් සභාව

Department of Education – Western Province

B මූලධර්මවාදී සභා

C මෙතෝදිස්ත සභාව

D දකුණු ඉන්දියානු සභා

(1) A, C හා D ය. (2) A හා B ය.

(3) B හා D ය. (4) B, C හා D ය.

(37) මල් උයනේ යාච්ඤාව මගින් අපට ඉදිරිපත් කරන ප්‍රබල පණිවිඩය වන්නේ,

(1) පවුලක් ලෙස ජපමාලය කිවයුතු බව

(2) සෑම වැදගත් අවස්ථාවකට ම යාච්ඤාවෙන් සූදානම් විය යුතු බව

(3) සෑම දිනක ම පාද නමස්කාරය කළ යුතු බව

(4) මල් උයනේ යාච්ඤාව නිතර සිහිකර ගත යුතු බව

(38) උත්තම පූජක යාච්ඤාව පුරා දිවයන එක් ප්‍රධාන තේමාවක් වන්නේ,

(1) දේව විශ්වාසයයි. (2) දේව ප්‍රේමයයි.

(3) එකමුතුකමයි. (4) දේව නමස්කාරයයි.

(39) ක්‍රිස්තුන් වහන්සේගේ, දේව මාතාවන්ගේ හා ශුද්ධවරයන්ගේ මංගල්‍යය වල දී භාවිතා කරන වර්ණය වන්නේ,

(1) රතු වර්ණය (2) දම් වර්ණය

(3) කොළ වර්ණය (4) සුදු වර්ණය

(40) මහා බ්‍රහස්පතින්දා ක්‍රිස්තුන් වහන්සේ තම ශ්‍රාවකයන්ගේ පාද සේදීමේ සිද්ධිය සඳහන් කරන සුවිශේෂකවරයා වන්නේ,

(1) ශුද්ධ වූ ජොහාන්තුමා (2) ශුද්ධ වූ මතෙව්තුමා

(3) ශුද්ධ වූ පේදුරුතුමා (4) ශුද්ධ වූ ලූක් තුමා

Department of Education – Western Province